# 2022 පෙබරවාරි මස 15 වන දින ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභා රැස්වීම් වාර්තාව

දිනය සහ වේලාව :- 2022.02.15 පෙ:ව: 09.30

ස්ථානය :- ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව

පැමිණීම:-

01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා — ගරු ප්‍රාදේශීය සභා සභාපති

02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා — ගරු ප්‍රාදේශීය සභා උප සභාපති

03. ආර්.පී. ගුණරත්න මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

05. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

06. එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

07. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

08. චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

09.ඒ.පී. කොල්වින් සිල්වා මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

10. සුබෝධා ලක්ෂානි රිබේරා මහත්මිය — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

11. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

12. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

13.එම්.ඒ.සුමේධ අලුත්ගමගේ මහතා — ගරුප්‍රාදේශීය සභා මන්ත්‍රී

14. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

15. එච්.පී.ආනන්ද කුලතිලක මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

16. එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

17. එස්. නිලාම් මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

18. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

19. එස්.පී. සරත් කුමාර ලාල් මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

20. රාජකුමාර් විදුෂණී මහත්මිය — ගරු ප්‍රාදේශීයසභා මන්ත්‍රිනී

නොපැමිණීම:-

01.ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

ගරු සභාපතිතුමා

අප ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩී.එම්.එල්.ඩී. දසනායක මිය අසනීප තත්වයෙන් පසු වෙන බැවින් අද දින ගරු මහා සභාවේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා අප සභාවේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී ටී.සී.පී.ද සිල්වා මිය සභාවේ වැඩ බලන ලේකම් වශයෙන් පත් කර ගන්නා බව මෙයින් නිවේදනය කරමි.

ගරු සභාපතිතුමා

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී සහ අනෙකුත් නිලධාරීන් සියලුදෙනා හා පැමිණ සිටි සියලුදෙනාම ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී.

සභා රැස්වීමට සහභාගීවූ සියල්ලෝම තම ආගම සිහිකර ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව මිය ගිය රණවිරුවන් හා මියගිය පළාත් පාලන ආයතන නියෝජිතයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් න්‍යායපත්‍රානුකූලව පසුගිය සභා වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

## 01.පසුගිය සභා වාර්තාව සම්මත කර ගැනීම

2022 ජනවාරි මස 18 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීමට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. විමලසේන පතිරණ මහතා

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ 02 වන පිටුවෙහි මාගේ සංශෝධනය ''කොවිඩ් නිසාම අසාර්ථක වුණා'' ලෙස නිවැරදි විය යුතුයි.

ගරු සභාපතිතුමා

එම ප්‍රකාශය සංශෝධනය කිරීමට කටයුතු කරන්න. වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2022.01.18 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනවලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට මා විසින් යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

යෝජනා ස්ථිරත්වයෙන් අනතුරුව 2022.01.18 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - ඇත

01. ''ගම සමඟ පිළිසඳරක් - 2022" වැඩසටහන යටතේ මන්ත්‍රී කොට්ඨාශ වල ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2022.02.15 වන දින පස්වරුවේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම්තුමිය හමුවන ලෙස මෙයින් නිවේදනය කරමි.

02. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 5 වන වගන්තියේ (2) උප වගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතාගේ නියමයෙන් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභිකයින්ගේ ධූර කාලය අවසන් වන දිනය 2023 මාර්තු මස 19 වන දින දක්වා දීර්ඝ කළ බව ප්‍රකාශයට පත් කර ඇති 2022.01.10 වන දිනැති රජයේ ගැසට් නිවේදනය සභා ගත කරමි.

03. 2021 ඔක්තෝබර් සහ නොවැම්බර් මාස වලට අදාළ මහා සභා රැස්වීම් වාර්තා වල නිරීක්ෂණ ඇතුළත් කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරමි.

04. ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඇත්ගාල සතිපොළ පරිශ්‍රයේ ඇති කඩ කාමර 03 වාර්ෂිකව ටෙන්ඩර් කළ අතර ඇත්ගාල, නාවලපිටිය පාර, අංක 840/ඒ, ලිපිනයෙහි පදිංචි පී. කවිදර්ශන් යන අය විසින් එහිදී වැඩිම මිළ ගණනක් ඉදිරිපත් කළ අතර එම කඩ කාමර 03 සඳහා ගෙවිය යුතු මුළු මුදල වන රුː 482,500.00 ක මුදල 2022.02.08 වන දින ගෙවා අවසන් කිරීම නිසා එම ඇත්ගාල සතිපොළ පරිශ්‍රයේ ඇති කඩ කාමර 03 පී. කවිදර්ශන් යන අය වෙත බදු අයිතිය පැවරීමට කටයුතු කළ බව මෙයින් නිවේදනය කරමි.

05. රාජ්‍ය දැව සංස්ථාව මෙහෙයවනු ලබන පැල්ලපිටිය හෙක්ටයාර 13.5 ක දැව කඳන් ඉවත් කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව පැල්ලපිටිය මාර්ගය භාවිතා කිරීමට අවසර ලබා නොදීමට අප සභාව විසින් තීරණය කරන ලදි. එම තිරණ දැනුම් දීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතිය රජයේ ප්‍රමුඛ සංවර්ධන වැඩසටහනක් යටතේ සිදු වන වැඩසටහනක් බැවින් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය දැව සංස්ථාව සමඟ සාකච්ඡා කර අදාළ කොන්ත්‍රාත්කරුගෙන් යම් මුදලක් සහා අරමුදලේ රඳවා ගැනීමට යටත්ව මේ වන විට අප සභාව විසින් ගෙන ඇති තිරණය නැවත සමාලෝචනය කිරීමට සභාව දැනුවත් කරන ලෙස දන්වමින් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ඉදිරිපත් කළ ලිපිය සභා ගත කරමි.

## 03. සභාවට ලැබී ඇති සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන - ඇත

01. ගම්පොළවෙල මාර්ගයේ කැඩීයාමට ලක්වූ පාලම නැවත ප්‍රතිසංස්කරණය කිරීම 2022.01.29 වන දින ගරු කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවූ අතර එහිදී පැවති උත්සවයේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට දිවා රාත්‍රී නොබලා සහයෝගය දැක්වූ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාටත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතාටත් අප ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාටත් සභාවේ සියලු නිලධාරීන් වෙතත් ස්තුතිය පුද කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කළ ලිපිය සභාගත කරමි.

## 04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත

## 05.යථා පරිදි කල්දී ඇති යෝජනා - ඇත

## 05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

## 05:01:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමාගේ චක්‍රලේඛ අංක 05/2010 (I) යටතේ පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා මහජන සම්බන්ධතා නිලධාරීන් පත් කිරීමේදී ඔවුන් වෙනුවෙන් මාසික දීමනාව රුෑ 25,000.00ක් දක්වා වැඩි කර ගෙවන ලෙස දන්වා ඇත. එහෙත් 2019.05.21 වන දින පැවති ගරු මහා සභාවේදී තීරණ අංක 06:03 යටතේ ගනු ලැබූ තීරණයට අනුව අප සභාවේ ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී හට රුෑ 15,000.00 ක දීමනාවක් ගෙවීමට තීරණය කරන ලදී . එහෙත් වර්තමානයේ පවතින ආර්ථික අපහසුතා සළකා අප ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී හට මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමාගේ චක්‍රලේඛ අංක 05/2010 (I) අනුව රුෑ 25,000.00 ක දීමනාවක් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා මහජන සම්බන්ධතා නිලධාරීන් පත් කිරීමේදී ඔවුන් වෙනුවෙන් මාසික දීමනාව රුෑ 25,000.00ක් ගෙවන ලෙස මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමාගේ චක්‍රලේඛ අංක 05/2010 (I) යටතේ දැනුම්දී තිබුණත් අද වන විටත් මාගේ මහජන සම්බන්ධතා නිලධාරී වෙත ගෙවන්නේ රුෑ 15,000.00 ක දීමනාවකි. එහෙත් වර්තමානයේ පවතින ආර්ථික අපහසුතා සැළකිල්ලට ගෙන අප ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී හට මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමාගේ චක්‍රලේඛ අංක 05/2010 (I) අනුව 2022 පෙබරවාරි මස සිට රුෑ 25,000.00 ක දීමනාවක් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව වෙනත් අදහසක් හෝ විරුද්ධත්වයක් ඇත්නම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

<u>තීරණයඃ-</u>

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී හට මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමාගේ චක්‍රලේඛ අංක 05/2010 (I) අනුව 2022 පෙබරවාරි මස සිට රුෑ25,000.00 ක දීමනාවක් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05:01:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2021.12.31 වන දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදුකර අවසන් වීමෙන් අනතුරුව ඒ සඳහා සකස් කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරනවා.මේ පිළිබඳව අදහස් දක්වන ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

මෙම යෝජනාව සඳහා විරුද්ධත්වයක් නොමැති බව  පෙනීයනවා.

තීරණය:-

ඒ අනුව 2021.12.31 වන දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05:01:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ ක්‍රියාත්මක කිරීමේ කමිටුව සඳහා ගරු සභිකවරුන් එක් අයෙක් හා ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී, ආදායම් පරීක්ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අනුව එම සමීක්ෂණයේදී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා කමිටුවක් පත්කිරීම අවශ්‍ය බැවින් ඒ සඳහා ගරු මන්ත්‍රීවරයෙකු හෝ ගරු මන්ත්‍රීවරියක පත්කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතා

ගරු සභාපතිතුමනි, 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ ක්‍රියාත්මක කිරීමේ කමිටුව සඳහා අප ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා සුදුසු බවට මා ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය:-

ඒ අනුව 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ ක්‍රියාත්මක කිරීමේ කමිටුව සඳහා ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී, ආදායම් පරීක්ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05:01:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වල වෙන්දේසි මිළ තක්සේරු කිරීමේ කමිටුව සඳහා ගරු සභිකවරුන් එක් අයෙක් හා ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී, ආදායම් පරීක්ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා

2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වල වෙන්දේසි මිළ තක්සේරු කිරීමේ කමිටුවක් අවශ්‍ය බැවින් ඒ සඳහා ගරු මන්ත්‍රීවරයෙකු හෝ ගරු මන්ත්‍රීවරියක පත්කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතා

ගරු සභාපතිතුමනි, 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වල වෙන්දේසි මිළ තක්සේරු කිරීමේ කමිටුව සඳහා අප ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී ඒ.පී. කොල්වින් සිල්වා මහතා සුදුසු බවට මා ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයනවා.

තීරණය:-

ඒ අනුව 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වල වෙන්දේසි මිළ තක්සේරු කිරීමේ කමිටුව සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී. කොල්වින් සිල්වා මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී, ආදායම් පරීක්ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05:01:05 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වෙන්දේසි කිරීමේ කාර්ය වෙනුවෙන් වෙන්දේසි කමිටුව සඳහා ගරු සභිකවරුන් එක් අයෙක් හා ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී, ආදායම් පරීක්ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී, විෂය නිලධාරී හා මුදල් අයකිරීමේ නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වෙන්දේසි කිරීමේ කාර්ය සඳහා වෙන්දේසි කමිටුවක් අවශ්‍ය බැවින් ඒ සඳහා ගරු මන්ත්‍රීවරයෙකු හෝ ගරු මන්ත්‍රීවරියක පත්කර ගන්නා ලෙස මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

ගරු සභාපතිතුමනි, 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වෙන්දේසි කිරීමේ කාර්ය සඳහා වෙන්දේසි කමිටුවට අප ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා සුදුසු බවට මා ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයනවා.

තීරණය:-

ඒ අනුව 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වෙන්දේසි කිරීමේ කාර්ය සඳහා වෙන්දේසි කමිටුව සඳහා අප ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී ආර්.පී.

ගුණරත්න මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්‍ෂණ නිලධාරී, ආදායම් පරීක්‍ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී, විෂය නිලධාරී හා මුදල් අයකිරීමේ නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05:01:06 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2022 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන යටතේ වසංගත රෝග පාලනය කිරීම සඳහා 205 (02) වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇති අතර එම ප්‍රතිපාදන මගින් කොවිඩ් - 19 වසංගතය පාලනය කිරීමට අදාළ එන්නත්කරණ වැඩසටහනේ වියදම් හා අනෙකුත් වියදම් දැරීමට මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමේදී වසංගත රෝග පාලනය කිරීම සඳහා 205 (02) වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. එම වැය ශීර්ෂය යටතේ කොවිඩ් - 19 වසංගතය පාලනය කිරීමට අදාළ එන්නත්කරණ වැඩසටහනේ වියදම් හා අනෙකුත් වියදම් දැරීමට මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව වියදම් දැරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය:-

ඒ අනුව 2022 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන යටතේ වසංගත රෝග පාලනය කිරීම සඳහා 205 (02) වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇති අතර එම ප්‍රතිපාදන මගින් කොවිඩ් - 19 වසංගතය පාලනය කිරීමට අදාළ එන්නත්කරණ වැඩසටහනේ වියදම් හා අනෙකුත් වියදම් දැරීමට මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05:01:07 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගරු මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කරන ලද රු: 500,000.00ට වඩා වැඩි වටිනාකමක් ඇති පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| අනු අංක | සංවර්ධන ව්‍යාපෘතිය | ගෙවීම් සිදු කරන ලද සමිතිය/ ආයතනය | මුදල |
|---|---|---|---|
| 01 | ක්‍රීඩා අමාත්‍යංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද වැටකේදෙණිය ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ මුදල් ගෙවීම | සමගි ග්‍රාම සංවර්ධන සමිතිය, බොස්වෝඩ් | රු:1,334,533.90 |
| 02 | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධන කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද සිංහපුර ගමේ සිට 16 කණුව දක්වා යන මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම | ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය | රු:884,675.00 |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

සභාව විසින් ගෙවීම් කරන ලද රුපියල් ලක්ෂ 5කට වැඩි ගෙවීම් සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගත යුතු අතර එම ගෙවීම් කඩිනමින් සිදු කළ යුතු බැවින් මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද අතර ඉහත සඳහන් කර ඇති ව්‍යාපෘති සඳහා සභාව වෙත ලැබුණු වෙනත් ප්‍රතිපාදන අදාළ කොන්ත්‍රාත් සමිති වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

<u>තීරණය:-</u>

ඒ අනුව ගරු මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කරන ලද රු: 500,000.00ට වඩා වැඩි වටිනාකමක් ඇති ඉහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>06. යථා පරිදි කල්දී නොමැති යෝජනා /හදිසි යෝජනා - ඇත</u>

## <u>06:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු සමෘද්ධි කඩ කාමර අංක 09 සහ අංක 10 කඩ හිමියන් 2019 වර්ෂයේ එම කඩ කාමර 02 වෙනුවෙන් තැන්පත් මුදල් ගෙවා ඇත. එම කඩ කාමර වල කඩ කුලී හිඟව පැවතීම හේතුවෙන් අදාළ කඩ කාමර වෙනුවෙන් තැන්පත් කරන ලද මුදල් කඩ කුලී සඳහා හිලව් කර ගන්නා ලෙස කඩ හිමියන් විසින් ඉල්ලීමක් කර ඇත. පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ අංක 2016/3 අනුව ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර හෝ දීර්ඝ කාලීන බදුදීමක් සිදුකර නොමැති හෙයින් කඩහිමියන් විසින් තැන්පත් කර ඇති මුදල කඩ කුලී සඳහා හිලව් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු සමෘද්ධි කඩ කාමර අංක 09 සහ අංක 10 කඩ හිමියන් 2019 වර්ෂයේ එම කඩ කාමර 02 වෙනුවෙන් තැන්පත් මුදල් ගෙවා ඇත. එම කඩ කාමර වල කඩ කුලී හිඟව පැවතීම හේතුවෙන් අදාළ කඩ කාමර වෙනුවෙන් තැන්පත් කරන ලද මුදල් කඩ කුලී සඳහා හිලව් කර ගන්නා ලෙස කඩ හිමියන් විසින් ඉල්ලීමක් කර ඇත. පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ අංක 2016/3 අනුව ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර හෝ දීර්ඝ කාලීන බදුදීමක් සිදුකර නොමැති හෙයින් කඩහිමියන් විසින් තැන්පත් කර ඇති මුදල කඩ කුලී සඳහා හිලව් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳව ගරු මහා සභාවේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතා</u>

ගරු සභාපතිතුමනි, මෙම තැන්පත් මුදල හිලව් කර ගත්තත් මාසික කඩ කුලිය අඛණ්ඩව සභාවට ගෙවන ලෙස එම කඩ හිමියන් දැනුවත් කිරීම සුදුසුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා</u>

ගරු සභාපතිතුමනි, මෙම කඩහිමින්ගෙන් සභාවට අයවිය යුතු හිඟ මුදල් තැන්පත් මුදලින් හිලව් කර ඉතිරි මුදල් මාස දෙකක් තුළ ගෙවා නිම කරන ලෙස ඔවුන්ව දැනුවත් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා</u>

ගරු සභාපතිතුමනි, මෙම කඩ හිමියන් මාසික කඩ කුලී නොගෙවුවොත් අපි එය සභාවට අය කර ගන්නා ක්‍රමවේදයක් තිබිය යුතුයි.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමා, මෙම කඩහිමියන් දෙදෙනා පමණයි හිඟයක් තියාගෙන යන්නේ. ඔවුන්ගෙන් දැනට හිඟව පවතින මුදල හිලව් කර ගෙන ඉදිරියට තිබෙන මාසික කුලී මුදල අය කර ගැනීමට කටයුතු කරනවා. එම නිසා කඩහිමියන් විසින් තැන්පත් කර ඇති මුදල කඩ කුලී සඳහා හිලව් කිරීම සුදුසුයි. වෙනත් අදහස් දැක්වීමක් නොමැති බව පෙනී යනවා.

<u>තීරණය:-</u>

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු සමෘද්ධි කඩ කාමර අංක 09 සහ අංක 10 කඩ හිමියන් විසින් සභාව වෙත ගෙවීමට ඇති හිඟ කඩකුලී මුදල් ඔවුන් විසින් 2019 වර්ෂයේ සභාවේ තැන්පත් කර ඇති මුදල කඩ කුලී සඳහා හිලව් කිරීම සුදුසු බවටත් සභාව වෙත ගෙවිය යුතු අනෙකුත් හිඟ මුදල් මාස දෙකක් තුළ ගෙවා නිම කරන ලෙසත් ඔවුන් දැනුවත් කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව සතු ජල පොම්පය අක්‍රිය වීම හේතුවෙන් එය නැවත අලුත්වැඩියා කර ගැනීම සඳහා මිළ ගණන් කැඳවූ අතර ඒ සඳහා පිනසේන ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් රුː 97,923.00 ක මුදලකට ජල පොම්පය අලුත්වැඩියා කිරීමට එකඟවී ඇත. ඒ අනුව රුː 97,923.00 ක මුදලක් වැය කර පිනසේන ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් ජල පොම්පය අලුත්වැඩියා කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

අප ප්‍රාදේශීය සභාව සතු ජල පොම්පය අක්‍රිය වීම හේතුවෙන් එය නැවත අලුත්වැඩියා කර ගැනීම සඳහා මිළ ගණන් කැඳවූවා. ඒ සඳහා මිළ ගණන් ඉදිරිපත් කළ පිනසේන ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් එය නැවත අලුත්වැඩියා කිරීමට රුː 97,923.00 මුදලක් වැය වන බව දන්වා තිබෙනවා. ඒ අනුව රුː 97,923.00 ක මුදලක් වැය කර පිනසේන ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් ජල පොම්පය අලුත්වැඩියා කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, අප සභාවෙන් ජලය බෙදා දීමට පසුගිය කාලයේ ජල පොම්ප දෙකක් තිබුණා. එකක් කැඩිලා නම් අනෙක් පොම්පය හදාගන්න තිබුණා. දෙකම කැඩෙන්න ඉඩ හරින්නේ නැතුව තවත් පොම්පයක් මිළදී ගැනීමට අවශ්‍ය කටයුතු යෙදීම සුදුසුයි. එම නිසා දැනට රුː 97,923.00 ක මුදලක් වැය කර පිනසේන ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් ජල පොම්පය අලුත්වැඩියා කර ගන්නා අතරතුර නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නව ජල පොම්පයක් මිළදී ගැනීමට අවශ්‍ය කටයුතු යොදන්න යැයි ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමා, ජල පොම්ප දෙකම අලුත්වැඩියා කිරීමට අපහසු ඊට අදාළ අමතර කොටස් වෙළඳපොලේ නොමැති වීමයි. අක්‍රියව පවතින ජල පොම්පය රුː 97,923.00 ක මුදලක් වැය කර පිනසේන ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් අලුත්වැඩියා කර ගන්නා අතරතුර නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නව ජල පොම්පයක් මිළදී ගැනීම සුදුසු බව ගරු මහා සභාවේ තීරණයයි. වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණයː-

ඒ අනුව ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව සතු දැනට අක්‍රියව පවතින ජල පොම්පය රුː 97,923.00 ක මුදලක් වැය කර පිනසේන ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් අලුත්වැඩියා කර ගැනීම සුදුසු බවටත් නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නව ජල පොම්පයක් කඩිනමින් මිළදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු උළපනේ පුස්තකාලය 2021.12.22 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි III වන ශ්‍රේණියේ මහජන පුස්තකාලයක් බවට ශ්‍රේණිගත කර ඇති අතර එම පුස්තකාලය සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩල සංයුතිය සපුරා ගන්නා ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇත. ඒ අනුව III වන ශ්‍රේණියේ මහජන පුස්තකාලයක් වන ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු උළපනේ පුස්තකාලයේ කාර්ය මණ්ඩල සංයුතිය සඳහා අවශ්‍ය වන තුන්වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුරු 01 ක්ද, පුස්තකාල සහායක තනතුරු 02 ක්ද සහ කාර්යාල කාර්ය සහායක තනතුරු 01ක්ද ඇති කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු උළපනේ පුස්තකාලය 2021.12.22 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි III වන ශ්‍රේණියේ මහජන පුස්තකාලයක් බවට ශ්‍රේණිගත කර ඇති බව ඉතාම සතුටින් යුතුව ගරු මහා සභාවට දැනුම් දෙනවා. එම පුස්තකාලය සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩල සංයුතිය සපුරා ගන්නා ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇත. ඒ අනුව III වන ශ්‍රේණියේ මහජන පුස්තකාලයක් වන ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු උළපනේ පුස්තකාලයේ කාර්ය මණ්ඩල සංයුතිය සඳහා අවශ්‍ය වන තුන්වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුරු 01 ක්ද, පුස්තකාල සහායක තනතුරු 02 ක්ද සහ කාර්යාල කාර්ය සහායක තනතුරු 01ක්ද ඇති කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනීයනවා.

තීරණය:-

ඒ අනුව III වන ශ්‍රේණියේ මහජන පුස්තකාලයක් වන ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු උළපනේ පුස්තකාලයේ කාර්ය මණ්ඩල සංයුතිය සඳහා අවශ්‍ය වන තුන්වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුරු 01 ක්ද, පුස්තකාල සහායක තනතුරු 02 ක්ද සහ කාර්යාල කාර්ය සහායක තනතුරු 01ක්ද ඇති කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ පෙර වර්ෂයට අදාළව වැඩියෙන් හා අඩුවෙන් ගිණුම් ගත කළ වටිනාකම් සමුච්ත අරමුදලට ගිණුම් ගත කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ පෙර වර්ෂයට අදාළව ආදායම් වියදම්, ණයහිමි ණයගැති වෙනස්කම්, කපාහැරීම් හා සංශෝධනයන් සමුච්ත අරමුදලට ගිණුම්ගත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා. ඒ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව සහ විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය:-

ඒ අනුව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ පෙර වර්ෂයට අදාළව වැඩියෙන් හා අඩුවෙන් ගිණුම් ගත කළ වටිනාකම් සමුච්ත අරමුදලට ගිණුම් ගත කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06:05 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගම්පොළ නගර සංවර්ධන සැළැස්ම යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර නොමැති ග්‍රාම නිලධාරී වසම් 08ක් වන පහත සඳහන් ග්‍රාම නිලධාරී වසම් පිළිබඳව අධ්‍යනය කිරීමේදී නාගරීකරණය වැඩි ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇති බව නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා ඇත. ඒ අනුව අප බල ප්‍රදේශයට අයත් පහත නම් සඳහන් ග්‍රාම නිලධාරී වසම් 08 නාගරික සංවර්ධන අධිකාරී නීති රීති ක්‍රියාත්මක බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| වරිපනම් අංකය | ග්‍රාම නිලධාරී වසම |
|---|---|
| 1067 | හැරකොළ |
| 1068 | වල්ලහගොඩ |
| 1070 | තැඹිලිගල |
| 1073 | ඇත්ගාල උතුර |
| 1074 | ඇත්ගාල නැගෙනහිර |
| 1075 | ඇත්ගාල බටහිර |
| 1077 | ගම්පොළවෙල |
| 1078 | මාළිගාපුරණ |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පී.ඩබ්.ජී.පී. ගුරුගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගම්පොළ නගරයෙහි ක්‍රමවත් සංවර්ධනයන් පදනම් කර ගනිමින් 2020 වර්ෂයේ සිට නාගරික සංවර්ධන අධිකාරිය මගින් ගම්පොළ නගර සංවර්ධන සැළැස්ම සකස් කරමින් පවතින අතර එම සැළැස්ම 2022 වසරේ

අවසන් කර ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. ඒ අනුව ගම්පොළ නගරයේ නාගරීකරණය, ජන ගහණ ව්‍යාප්තිය, භූමි පරිහරණ රටාව ආදී කරුණු පදනම් කර ගනිමින් නගර සංවර්ධන සැළැස්ම සකස් කළ යුතු ප්‍රදේශය එම අධිකාරිය විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව දැනට නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශයට අමතරව අප බල ප්‍රදේශයට අයත් ඉහත ග්‍රාම නිලධාරී වසම් 08 අධ්‍යනය කිරීමේදී නාගරීකරණ වැඩි ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇති බව නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා ඇත. එම ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශ ලෙස පත් කිරීමෙන් අනතුරුව නාගරික සංවර්ධන අධිකාරී නීති රීති ක්‍රියාත්මක කිරීම හා සැළසුම් කටයුතු සඳහා ප්‍රාදේශීය සභාව වෙත බලය පැවරීමට නියමිත අතර සැළසුම් සහ සංවර්ධන කටයුතු වලදී නාගරික සංවර්ධන අධිකාරිය මගින් සම්බන්ධීකරණය සහ උපදේශනය ලබා දිය හැකි බව දන්වා ඇත. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරී නීති රීති ක්‍රියාත්මක බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය මහා සභා අනුමැතිය ලබා දෙන ලෙස එම අධිකාරිය විසින් ඉල්ලීම් කර ඇත. ඒ අනුව අප බල ප්‍රදේශයට අයත් ඉහත නම් සඳහන් ග්‍රාම නිලධාරී වසම් 08 නාගරික සංවර්ධන අධිකාරී නීති රීති ක්‍රියාත්මක බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳව මා ගරු මහා සභාවේ එකඟතාව ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි, මෙම ඉල්ලීම් කර ඇති ප්‍රදේශ නාගරීකරණයට අපි අත්හැරියත් ප්‍රජාවගේ පැත්තෙන් ඔවුන් සාධාරණයි. ඔවුන් කැමති නගරයේ පාසලකට දරුවන් යවන්න. බැංකු ණය ලබා ගැනීමේදී ඔවුන්ට විශාල වාසි තියෙනවා. ඒ නිසා මෙහි දෙපැත්තක් තියෙනවා. ඒ පිළිබඳව සිතා තීරණයක් ගැනීම සුදුසුයි.

ගරු උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමනි, අපි මෙම කොටස නාගරික සංවර්ධන අධිකාරියට පවරා දුන්නත් අපිට එම කොටස් නඩත්තු කිරීමට අපහසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි, මම දන්නා ආකාරයට මෙම අධිකාරියට විශාල බලයක් තියෙනවා. ඒ නිසා මේ පිළිබඳව තවත් සිතිය යුතුයි.

ගරු සභාපතිතුමා

එසේනම් මහා සභාවේ අදහස ඉහත සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාශ නාගරික සංවර්ධන අධිකාරියට පවරා නොදීම සුදුසුයි යන්නයි.

තීරණය:-

ඒ අනුව අප බල ප්‍රදේශයට අයත් ඉහත නම් සඳහන් ග්‍රාම නිලධාරී වසම් 08 නාගරික සංවර්ධන අධිකාරී නීති රීති ක්‍රියාත්මක බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය සභා අනුමැතිය ලබා නොදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි.

## 07. කාරක සභා වාර්තා සළකා බැලීම

### 01.මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව

2022.02.08 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා ගත කරන ලදි. ඒ අනුව 2022 වර්ෂයට අදාළ ආදායම් වියදම් පුරෝකථනයද, 2022 ජනවාරි මස මුළු ලැබීම් රු:36,563,082.50 ක්ද මුළු වියදම රු:15,952,248.02 ක්ද විය. 2022 ජනවාරි මසට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශයද 2022.02.08 වන දින මහනුවර විගණන අධිකාරී වෙත යොමුකර ඇත.

## 08.සභාවේ මාසික ලැබීම් හා ගෙවීම් වාර්තාව

2022.02.01 සිට 2022.02.11 වන දින දක්වා ගෙවීම් වාර්තාව සභාගත කරන ලදි.

| අනු අංකය | දිනය | ආදයකයා | ගෙවීම් විස්තරය | වවුචර අංකය | හරස් සටහන් | මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | 2022-02-01 | කේ.ජී.ගයාන් නිරංජල මයා - ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරි | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරි මහතාට 2022 ජනවාරි මස දීමනාව ගෙවීම. | 109 | | 15,000.00 |
| 2 | | රාක්ෂාව ගොවි සංවිධානය - උඩහෙන්තැන්න | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද පරගල බස්නැවතුම සිට පරගල ජනපදය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 110 | 6,119.71 | 341,563.32 |
| 3 | | රාක්ෂාව ගොවි සංවිධානය - උඩහෙන්තැන්න | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද පරගල බස්නැවතුම සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 111 | 6,215.15 | 347,194.27 |
| 4 | | පී.ඕ.පී.ධම්මික නදීර ජයසේකර මහතා - ගරු සභාපති | කොළඹ ක්‍රීඩා අමාත්‍යාංශයේ සිට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව දක්වා ක්‍රීඩා උපකරණ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් (ඉසුරු මෝටර්ස් ආයතනය වෙත ගෙවන ලද මුදල වන රු 28000 ) අතින් වියදම් වූ මුදල ගෙවීම. | 112 | | 28,000.00 |
| 5 | | පී.පී.එස්.ජේ කිත්සිරි මයා - සංවර්ධන නිලධාරි | ජාතික නිදහස් දින රුක්රෝපන වැඩසටහනට සමගාමීව රුක් රෝපන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදල සංග්‍රහ වියදම් වෙනුවෙන් අත්තිකාරම් මුදල ගෙවීම. | 113 | | 5,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 6 | | මියනගොල්ල ගොවි සංවිධානය - දොලොස්බාගේ | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද රාවනා අසපුව අසලින් වැටී ඇති සෙන් කැතරින් මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 114 | 6,152.55 | 343,500.78 |
| 7 | | හල්දෙල ග්‍රාම සංවර්ධන සමිතිය - උඩහෙන්තැනන | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද බෝගහකොළය පහළ මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 115 | 6,161.56 | 344,032.27 |
| 8 | | ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලය - කුරුදුවත්ත | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද කරගල ප්‍රධාන මාර්ගයේ සිට උද්දල් තුඩුව හංදියේ නො. 12 මැදගොඩ මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 116 | 8,683.76 | 440,342.13 |
| 9 | | ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලය - කුරුදුවත්ත | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද කුරුදුවත්ත බෝගහ අසලින් ඇරඹෙන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 117 | 6,167.08 | 344,358.18 |
| 10 | | උඩහේන්තැන්න ගොවි සංවිධානය - උඩහේනතැන්න | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද උඩහෙන්තැන්න ජනඋදන ගම්මානයට යන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 118 | 25.00 | 354,722.04 |
| 11 | | ආර් අයි කේ කරුණාරත්න මයා - රියදුරු | නිවසේ අලුත් වැඩියා කටයුත්තක් සඳහා ආපදා ණය මුදල ගෙවීම. | 119 | | 27,100.00 |
| 12 | 2022-02-02 | සාමග්‍රි ග්‍රාම සංවර්ධන සමිතිය - මීතලාව | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද වැලිකන්දගම හරහා තැලිහුන්න ජනපද මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 120 | 6,138.04 | 341,944.50 |
| 13 | | සාමග්‍රි ග්‍රාම සංවර්ධන සමිතිය - මීතලාව | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද අලුගොල්ල පාලුවත්ත මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 121 | 6,304.53 | 352,467.60 |
| 14 | | සමගි ග්‍රාම සංවර්ධන සමිතිය - බොස්වෝඩ් | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද වැටකේදෙණිය ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 122 | 22,567.23 | 1,311,966.67 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 15 | | සමගි ග්‍රාම සංවර්ධන සමිතිය - බොස්වෝඩ් | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද වැටකේදෙණිය ජනපදයේ සිට අතුරු මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 123 | 6,163.74 | 344,160.90 |
| 16 | | ගල්පාය ග්‍රාම සංවර්ධන සමිතිය - ගල්පාය | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ගල්පාය අඹගස්තැන්න සුසාන භූමියට යන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 124 | 6,170.97 | 344,587.26 |
| 17 | | ගල්පාය ග්‍රාම සංවර්ධන සමිතිය - ගල්පාය | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද හේමලතා මියගේ ගල්පාය නිවස දෙසට යන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 125 | 2,649.09 | 136,796.76 |
| 18 | | ගල්පාය ග්‍රාම සංවර්ධන සමිතිය - ගල්පාය | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ගල්පාය සුදර්ශිනාරාම විහාරස්ථනයේ පිවිසුම් මාර්ගය ඉතිරි කොටස සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 126 | 5246..10 | 290,020.23 |
| 19 | | ඒ.එස් ජේ. සදරුවන් පෙරේරා මයා (බර වාහන ක්‍රියාකරු ) | 2022 ජනවාරි මස සේවක වැටුප් ගෙවීම. | 127 | | 44,184.80 |
| 20 | | ඩබ්.ලසන්ත මනෝජ් මයා ( රියදුරු ) | 2022 ජනවාරි මස සේවක වැටුප් ගෙවීම. | 128 | | 44,184.80 |
| 21 | | ඩබ්.එම්.එම් බණ්ඩාර මයා (කොන්ත්‍රාත් - තාක්ෂණ නිලධාරි ) | 2022 ජනවාරි මස සේවක වැටුප් ගෙවීම. | 129 | | 61,903.00 |
| 22 | | උඩුවැල්ල එකමුතු ග්‍රාම සංවර්ධන සමිතිය - උඩහෙන්තැන්න. | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද තිබ්බටුපොල හරහා මොස්විල් ජනපදයට යන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 130 | 6,137.50 | 342,612.86 |
| 23 | 2022-02-03 | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | උලපනේ කසල මධ්‍යස්ථානයේ දෛනික පදනම මත සේවයේ යෙදෙන සෞඛ්‍ය කම්කරු 04 දෙනෙකු සඳහා 2022 ජනවාරි මස වැටුප් ගෙවීම. | 131 | | 137,088.13 |
| 24 | 2022-02-08 | ගල්පාය ගොවි සංවිධානය - ගල්පාය | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ලැන්ටන්හිල් කනත්ත පාර සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 132 | 6,142.88 | 342,930.36 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 25 | | මා ඔය ගොවි සංවිධානය - උඩහේනතැන්න | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ඉරහඳගම ගමමැද මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 133 | 6,925.94 | 347,131.03 |
| 26 | | රන්කෙත ගොවි සංවිධානය - ඇත්ගාල බටහිර | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද බ්‍රිසයිඩ් බණ්ඩාරවත්ත පන්සල අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 134 | 6,308.17 | 347,097.92 |
| 27 | | රන්කෙත ගොවි සංවිධානය - ඇත්ගාල බටහිර | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද හලාගම බ්‍රිසයිඩ් මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 135 | 7,615.10 | 345,790.99 |
| 28 | | කුරුදුවත්ත අත්කම් නිවාස ග්‍රාම සංවර්ධන සමිතිය - කුරුදුවත්ත | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද පහළ තැලිහුන්න කවුග්ගල මාර්ගයේ පාලම දෙපස කොටස සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 136 | 6,236.79 | 348,470.85 |
| 29 | | කේ.පී ක්‍රිශාන්ත සමන්සිරි මයා - මාර්ග කම්කරු | නිවසේ අලුත් වැඩියා කටයුත්තක් සඳහා ආපදා ණය මුදල ගෙවීම. | 137 | | 48,300.00 |
| 30 | | ගම්පොලවෙල ග්‍රාම සංවර්ධන සමිතිය- ගම්පොලවෙල | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ගම්පොලවෙල රජඇලගම ආනන්ද මහතාගේ නිවස ඉදිරිපස මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 138 | 6,914.19 | 346,437.58 |
| 31 | 2021-02-09 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංසථාව - මහරගම | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංසථාවෙන් ලබා ගන්නා ඖෂධ සඳහා මුදල් ගෙවීම. | 139 | | 32,755.00 |
| 32 | | සීමාසහිත සමූපකාර රකෂණ සමාගම - ගම්පොල | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සේවය කරන බැකෝ යන්ත්‍ර රියදුරු 2022 වර්ෂය සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 140 | | 1,989.59 |
| 33 | | සීමාසහිත සමූපකාර රකෂණ සමාගම - ගම්පොල | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සේවය කරන බැකෝ යන්ත්‍ර රියදුරු 2022 වර්ෂය සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 141 | | 1,377.25 |
| 34 | | පී. කවිදර්ශනා මිය - භාෂා පරිවර්තක | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2021 නොවැම්බර් මස පැවති මහ සභා වාර්තාව දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම වෙනුවෙන් ගෙවීම | 142 | | 10,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 35 | | සී/ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය - කුරුදුවත්ත | 2021 දෙසැම්බර් 31 දින සිට 2022 ජනවාරි 13 දින දක්වා ණය පදනම මත ලබාගත් ඉන්ධන වෙනුවෙන් ගෙවීම. ( මීට අදාල විස්තර අමුණා ඇත ) | 143 | | 125,600.40 |
| 36 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | කාර්යාල ලිපි තැපැල් කිරීම සඳහා මුද්දර ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. | 144 | | 8,000.00 |
| 37 | | එම්. පි. සිසිර කුමාර මයා - වැඩ මූලික | කුරුදුවත්ත ක්‍රීඩා පිටියේ සිට පැරණි සභා භූමිය වෙත ගබඩා කාමරය ඉදි කිරීමට ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම වෙනුවෙන් අතින් වියදම් වූ මුදල ගෙවීම. | 145 | | 1,000.00 |
| 38 | | ඩබ් ජේ. .පී ගුණරත්න මයා - ආදායම් පරීක්ෂක | පරිවර්තිත ගමන් වියදම් දීමනාව ගෙවීම. - 2021 ජනවාරි | 146 | | 4,900.00 |
| 39 | | බී.ජී.ටී දිසානායක මයා - සංවර්ධන නිලධාරී | පරිවර්තිත ගමන් වියදම් දීමනාව ගෙවීම. - 2021 ජනවාරි | 147 | | 4,700.00 |
| 40 | | බී.ජී.ටී දිසානායක මයා - සංවර්ධන නිලධාරී | 2022.01.03,24,27 දින වල රාජකාරි කටයුත සඳහා (පල්ලෙකැලේ ) යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම . | 148 | | 2,000.00 |
| 41 | | ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය - සිංහපුර | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන - 2020 යටතේ ක්‍රියාත්මක කරන ලද ඇත්ගාල නගරයේ සතිපොළ ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම කර්මාන්තයේ අතරැදි මුදල් ගෙවීම. | 149 | | 17,496.34 |
| 42 | | එම්.පී.දර්ශන බණ්ඩාර ධර්මරත්න මයා - කුරුදුවත්ත | **Covid 19** එන්නත්කරණ වැඩ සටහන සඳහා (2022.01.19 දින පැවති කුරුදුවත්ත රාජකීය ) එම මධ්‍යස්ථානයට කෑම සහ තේ ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම.( 60×275) | 150 | | 16,500.00 |
| 43 | | එම්.පී.දර්ශන බණ්ඩාර ධර්මරත්න මයා - කුරුදුවත්ත | 2022.01.11 දින ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මුදල් කාරක සභාවට හා 2022.01.18 දින මහ සභාවට සහභාගි වූ මන්ත්‍රීතුමන් හා නිලධාරීන් සඳහා සංග්‍රහ කටයුතු වෙනුවෙන් වියදම් වූ මුදල ගෙවීම | 151 | | 2,880.00 |
| 44 | 2022-02-11 | කේ.කේ. වසන්ත බණ්ඩාර මයා - ගම්පොල | **Covid 19** එන්නත් කරණ වැඩ සටහන සඳහා (2022.01.19 දින පැවති කුරුදුවත්ත රාජකීය , උඩගම සරණපාල යන විද්‍යාල ) එම මධ්‍යස්ථාන 02 සඳහා පුටු, හට් ආවරණ , නෙස්කැපේ මැෂින් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 152 | 25.00 | 25,175.00 |
| 45 | | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය , පේරාදෙණිය | ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ 2021 දෙසැම්බර් මස ජල බිල්පත් ගෙවීම | 153 | | 2,808.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 46 | | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය , පේරාදෙණිය | ඇත්ගාල ක්‍රීඩා පිටියේ 2021 දෙසැම්බර් මස ජල බිල්පත් ගෙවීම | 154 | | 1,309.14 |
| 47 | | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය , පේරාදෙණිය | උලපනේ පුස්තකාලයේ 2021 දෙසැම්බර් මස ජල බිල්පත් ගෙවීම | 155 | | 788.22 |
| 48 | | සමඟි ප්‍රජා මූල සංවිධානය - කුරුදුවත්ත | කුරුදුවත්ත ප්‍රාදේශීය සභා ක්‍රීඩා පිටියේ ජල බිල ගෙවීම. 2021- දෙසැම්බර් | 156 | | 2,820.00 |
| 49 | | ජෝන් කිල්ස් ඔෆිස් ඔටෝමේෂන් ප්‍රයිවට් ලිමිටඩ් - කොළඹ 02 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ PC 061958 POTO COPY යන්ත්‍රය සේවා කිරීම වෙනුවෙන් ගෙවීම. | 157 | | 17,370.16 |
| 50 | | ජෝන් කිල්ස් ඔෆිස් ඔටෝමේෂන් ප්‍රයිවට් ලිමිටඩ් - කොළඹ 02 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ DD 02136 DUPLO යන්ත්‍රය සේවා කිරීම වෙනුවෙන් ගෙවීම. | 158 | 25.00 | 26,537.59 |
| | | එකතුව | | | 135,848.98 | 8,774,895.92 |

## 09. වෙනත්

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. චාමික අනුරාධ රත්නායක මහතා අසනීපවීම හේතුවෙන් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

නිවාඩු අනුමත කරන ලදි.

02. 2021.07.18 වන දින සිට 2021.12.14 වන දින දක්වා මහා සභාවේ ගනු ලැබූ තීරණ වල ප්‍රගතිය සභා ගත කරන ලදි.

2021.07.18 වන දින මහා සභාවේ ගනු ලැබූ තීරණ වල ප්‍රගතිය

| තීරණ අංකය | තීරණය | ගත් ක්‍රියා මාර්ගය/ ප්‍රගතිය |
|---|---|---|
| 05:01:02 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර වල බදු අයිතිය මාරු කිරීමේදී එම කඩ වලින් අය කරනු ලබන පැවරුම් ගාස්තුව රුः 75,000.00ක් ලෙසට අය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | පැවරුම් ගාස්තුව රුः 75,000.00ක් ලෙසට අය කරනු ලැබේ. |
| 05:01:03 | එන්.එම්.එම්. රාසික් මයා වෙත බදුදී ඇති කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ අංක 20 දරණ කඩ කාමරයේ බදු අයිතිය ආර්.පී. මංජුලා සෙව්වන්දි රාජපක්ෂ යන අයට පවරා දීම සුදුසු බවටත් එම බදු අයිතිය මාරු කිරීමේදී නව තක්සේරුව අනුව අප සභාවට අය විය යුතු මුළු මුදල වන රුः 334,300.00 ක මුදල අය කර බදු අයිතිය මාරු කිරීම සුදුසු බවටත් පැවරුම් ගාස්තු අය කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | මංජුලා සෙව්වන්දි රාජපක්ෂ යන අයට මුදල් ගෙවන ලෙස දන්වා ඇතත් මේ වන තෙක් එම මුදල් ගෙවා බදු අයිතිය මාරු කර ගැනීමට ඉදිරිපත් වී නැත. |
| 05:01:04 | එච්.ඒ. සුජිත් ධම්මික මිහිර බණ්ඩාර මයා වෙත බදුදී ඇති ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ අංක 06 දරණ කඩ කාමරයේ බදු අයිතිය ඒකනායක මුදියන්සේලාගේ නිශ්ශංක ඊරියගම යන අයට පවරා දීම සුදුසු බවටත් එම බදු අයිතිය මාරු කිරීමේදී නව තක්සේරුව අනුව අප සභාවට අය විය යුතු මුළු මුදල වන රුः 3000.00 ක මුදල අය කර බදු අයිතිය මාරු කිරීම සුදුසු බවටත් පැවරුම් ගාස්තු අය කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | සියලු මුදල් අය කර ඇත. එහෙත් ගිවිසුම්ගත වීමට දැනුම් දී ඇතත් ඔවුන් ඒ සඳහා ඉදිරිපත්වී නොමැත. |
| 05:01:05 | සභා අරමුදල් 2021 ගරු මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ සුභ සාධක සමිති සඳහා ද්‍රව්‍ය හා උපකරණ ලබාදීමත් දිළිඳු පවුල් සඳහා සෙවිලි තහඩු ලබා දීමත් යන කාරණාවන්ට අදාළව ඉහත නම් සඳහන් ප්‍රතිලාභීන් සඳහා එම ද්‍රව්‍ය සහ උපකරණ ලබාදීම සුදුසු බවටත් ඒ සඳහා ගරු | ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කර ඇත. |

| | | |
|---|---|---|
| | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | |
| 05:01:06 | 2021 සංවර්ධන සැළැස්ම ක්‍රියාත්මක කිරීම යටතේ අසුපිනි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙහි මුළු ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 25 නොඉක්මවන බැවින් මධ්‍යම පළාත තුළ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | කොන්ත්‍රාත් පිරිනමා ඇත. |
| 05:01:07 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත අසුපිනි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රසම්පාදන කටයුතු සඳහා තාක්ෂණ ඇගයුම් කමිටුව ලෙස එම තාක්ෂණ ඇගයුම් කමිටුවේ සභාපති ඉංජිනේරු ඒ.ඒ.ඩී.සී.ආර්. අළුත්ගම මහතා, එම කමිටුවෙහි පළමු කමිටු සාමාජික ලෙස ගණකාධිකාරි පී.පී. චමිලා කුමාරි මහත්මිය සහ එම කමිටුවෙහි දෙවන කමිටු සාමාජික ලෙස තාක්ෂණ නිලධාරි ඒ.පී.එන්.එම්.ජේ.එස්.කේ.නවරත්න මහතා පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ඉටු කර ඇත. |
| 05:02 | සභා අරමුදල් 2020 යටතේ ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ද්‍රව්‍ය හා උපකරණ ලබාදීම යටතේ 519/20, බොස්වෝර්ඩ් ජනපදයේ පදිංචි එස්.පී. ප්‍රියන්ත කුමුදුලාල් මයා මේ වන විට පදිංචිය හැර ගොස් ඇති බැවින් එම මහතා හට ලබා දීමට අනුමැතිය ලද සෙවිලි තහඩු කට්ටි අංක 41, වැටකේදෙණිය ජනපදය, උඩහේන්තැන්න ලිපිනයේ පදිංචි එම්.පී. අබේසිංහ මයා වෙත ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කර ඇත. |
| 06:01 | කොවිඩ් 19 වසංගතය මර්ධනය කිරීමේ කටයුතු සඳහා ගඟ ඉහළ කෝරළේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය වෙත පළාත් සභාව මගින් ලබා දී ඇති GL – 3979 අංක දරණ වාහනයට අදාළ මාසික ධාවන සටහන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් සහතික කිරීමෙන් පසුව එම වාහනය සඳහා ඉන්ධන ලීටර 100ක් ලබා දීම සුදුසු බවටත් ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | GL– 3979 අංක දරණ වාහනයයේ අදාළ මාසික ධාවන සටහන් අප වෙත මෙතෙක් ලැබී නොමැත. |
| 06:02 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත් වන වයස අවුරුදු 30ට වැඩි අය සඳහා කොවිඩ් මර්ධන එන්නත්කරණ වැඩසටහන 2021.07.19, 20 සහ 21 යන තෙදින තුළ සිදුකරන බැවින් ඒ සඳහා සභාව මගින් ඉටු කළ යුතු කාර්යයන් වෙනුවෙන් වැය වන ප්‍රතිපාදන මුදල් සභා අරමුදලින් දැරීම සුදුසු බවටත් ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | ලිපි ලේඛන සකස් කරමින් පවතී |
| 06:03 | 2021 වර්ෂයේ අයවැය මගින් වසංගත රෝග මර්ධනය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන හෙයින් 3-24 අය ශීර්ෂය යටතේ සභාවට අයවේ යැයි අපේක්ෂා කරන ලද මුදල ඉක්මවා ලද ලැබීම් වසංගත රෝග මර්ධනය වෙනුවෙන් වෙන් කිරීමට සකස් කරන ලද පරිපූරක ඇස්තමේන්තුව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | පරිපූරක ඇස්තමේන්තුව අනුව ප්‍රතිපාදන යොදා ගත් වැය ශීර්ෂ සඳහා මුදල් යොදවා ඇත. |
| 06:04 | සභා අරමුදල් 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද කුරුඳුවත්ත මහජන ක්‍රීඩාංගනයේ විදුලි රැහැන් ඇදීම කර්මාන්තයේ මුදල් එම කර්මාන්තය ක්‍රියාත්මක කළ පැල්ලපිටිය උතුර ගොවි සංවිධානය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ගෙවීම් සිදු කර ඇත. |
| 06:05 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ කඩ කාමර පිටුපසට දිගු කර ගැනීමට අදාළව වෙළඳ සංකීර්ණයේ සැළැස්මට අනුව අප සභාවේ තාක්ෂණ නිලධාරි මහතාගේ පූර්ණ අධීක්ෂණය යටතේ එම වැසිකිළි පද්ධතිය කඩා ඉවත් කිරීම සුදුසු බවටත් එම කඩ කාමර නවීකරණය කිරීම එහි සැළැස්මට අනුව සිදු කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභාවේ තාක්ෂණ නිලධාරි මහතාගේ පූර්ණ අධීක්ෂණය යටතේ එම වැසිකිළි පද්ධතිය කඩා ඉවත් කර කඩ කාමර අලුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතී. |

## 2021.08.18 වන දින මහා සභාවේ ගනු ලැබූ තීරණ වල ප්‍රගතිය

| තීරණ අංකය | තීරණය | ගත් ක්‍රියා මාර්ගය/ ප්‍රගතිය |
|---|---|---|
| 05:01:02 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ ග්‍රාමීය මාර්ග සහ අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යංශය මගින් අප බල ප්‍රදේශයට වෙන් කරදී ඇති රුපියල් මිලියන 62ක ප්‍රතිපාදන මුදල් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට | ගිවිසුම් ගතවූ ව්‍යාපෘති 06 ක වැඩ අවසන් කර ඇත. |

| | | |
|---|---|---|
| | අදාළ කොට්ඨාශයේ ලියාපදිංචි කොන්ත්‍රාත් සමිති මගින් ගිවිසුම් ගතව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | |
| 06:01 | රජයේ තක්සේරු වාර්තාවට අනුව 2019.09.01 දින සිට 2021.02.28 දක්වා මාසික වෙළඳ පොල කුලිය රුː 18,000.00ක් ලෙසද 2021.03.01 දින සිට 2022.08.31 වන දින දක්වා මාසික වෙළඳපොල කුලිය රුː 20,000.00 ක් ලෙසද මාසිකව කුලී මුදල් අය කර අප සභාව සතු කුරුඳුවත්ත ආයුර්වේද ගොඩනැගිල්ලෙහි උඩු මහලෙහි පිහිටි ලංකා බැංකු ශාඛාව පවත්වාගෙන යාම සඳහා මාසික කුලී පදනම මත බදුදීම සුදුසු බවටත් ගිවිසුම් ගතවීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | පළාත් පලාන කොමසාරිස්තුමාගේ උපදෙස් අනුව නැවත සභා තීරණයක් ගෙන රුː 18,000.00ක මාසික කුලී මුදලක් අය කරනු ලැබේ. |
| 06:02 | ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත් වන වයස අවුරුදු 30ට වැඩි ජනතාව සඳහා ලබා දෙන කොවිඩ් මර්ධන දෙවන එන්නත්කරණ වැඩසටහන මධ්‍යස්ථාන 04කදී 2021.08.24,25,26,27 සහ 28 යන දින තුළ සිදුකරන බැවින් ඒ සඳහා සභාව මගින් ඉටු කළ යුතු කාර්යයන් වෙනුවෙන් වැය වන ප්‍රතිපාදන මුදල් සභා අරමුදලින් දැරීම සුදුසු බවටත් ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | ලිපි ලේඛන සකස් කරමින් පවතී |
| 06:03 | ප්‍රාදේශීය සභාව සතු ඇත්ගාල සතිපොළ භූමියේ වෙන් කර ඇති කඩ කාමර තුන සඳහා රජයේ තක්සේරුව ලැබීමෙන් පසුව එම තක්සේරුව අනුව ප්‍රාදේශීයව ටෙන්ඩර් කැඳවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ප්‍රාදේශීයව ටෙන්ඩර් කැඳවා කඩ කාමර බදු දී ඇත. |
| 06:04 | ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වයස අවුරුදු 30ට වඩා වැඩි පුද්ගලයින් සඳහා කොවිඩ් මර්ධන දෙවන එන්නත් මාත්‍රාව ලබා දීමේ වැඩ සටහන මධ්‍යස්ථාන 04කදී 2021.08.24,25,26,27 සහ 28 යන දින වල පැවැත්වීමට නියමිත බැවින් එම දින වල රාජකාරි කටයුතු සිදු කරන රාජ්‍ය නිලධාරීන් සඳහා සංග්‍රහ වියදම් දැරීම වෙනුවෙන් රුː 75,000.00ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | අත්තිකාරම් මුදල් ලබා ගෙන ඇත. |
| 06:05 | සභා අරමුදල් 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද උලපනේ බෝගොල්ල වෙද මහතාගේ නිවස අසලින් යන පාර සංවර්ධනය කිරීම කර්මාන්තය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රුː 145,798.08 ක මුදල එම කර්මාන්තය ක්‍රියාත්මක කළ උලපනේ දකුණ බෝගොල්ල සුහද ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ගෙවීම් සිදු කර ඇත. |
| 06:06 | සභා අරමුදල් 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද උලපනේ කසළ අංගනයේ ඉදිරිපස ගොඩනැගිල්ල ඉදිකිරීම කර්මාන්තය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රුː 887,786.52 ක මුදල එම කර්මාන්තය ක්‍රියාත්මක කළ සිංහපුර ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ගෙවීම් සිදු කර ඇත. |
| 06:07 | සභා අරමුදල් 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ඇත්ගාල නැගෙනහිර සමිති ශාලාව ඉදිකිරීම කර්මාන්තය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රුː 490,950.72 ක මුදල එම කර්මාන්තය ක්‍රියාත්මක කළ ඇත්ගාල නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ගෙවීම් සිදු කර ඇත. |
| 06:08 | දොලොස්බාගේ රෝහලේ පොදු භාවිතයට අවශ්‍ය වන වැසිකිළිය එම කොට්ඨාශය භාර මන්ත්‍රීවරුන් වන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී. කොල්වින් සිල්වා මහතාගේ සභා අරමුදල් ප්‍රතිපාදන මුදලින් දැරීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කර ඇත. |

## 2021.09.21 වන දින මහා සභාවේ ගනු ලැබූ තීරණ වල ප්‍රගතිය

| තීරණ අංකය | තීරණය | ගත් ක්‍රියා මාර්ගය/ ප්‍රගතිය |
|---|---|---|
| 05:01:01: I | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත පිහිටි දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කරන ලද උලපනේ, දොලොස්බාගේ, රාක්ෂාව යන ප්‍රදේශවල පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ගෙපත්වල 2021 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2022 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හය (6%) ක වරිපනමක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහːඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6)වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී | 2022.01.01 සිට බදු අයකරයි. |

| | | |
|---|---|---|
| | වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30,දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | |
| 05:01:01:II | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1)වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2021 වර්ෂයේදී බලාත්මක කරන ලද සත්‍යෙක්ෂණය කිරීම 2022 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී පනතේ 134 වන වගන්තියේ (3)වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද ,ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේවූ ඉඩම් සඳහා 2022 වර්ෂයට අදාළව අක්කර බදු අය කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | 2022.01.01 සිට බදු අයකරයි. |
| 05:01:01:III | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1)වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන ඉහත උප ලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උප ලේඛනයේ II වන තීරුවේ,ඒ එක් එක් කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරන ලදි. | 2022.01.01 සිට බදු අයකරයි. |
| 05:01:01:IV | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1)වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බල පත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2021 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැන්තතෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි ඉහත උප ලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරන ලදි. | 2022.01.01 සිට බදු අයකරයි. |
| 05:01:01:V | ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවක් යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය තුළදී නිකුත් කරන ලද බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර පහත උප ලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උප ලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,එකී උප ලේඛනයේ සඳහන් කර්මාන්තය ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක් වනවිට, එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම් වලින් සියයට එක (1%)ක ප්‍රමාණය බලපත්‍ර ගාස්තු විය යුතුය. හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ ක්‍රියාත්මක වන පළමු අවුරුද්ද වන අවස්ථාවක II වන තීරුවේ නිරූපිත ප්‍රමාණය බලපත්‍ර ගාස්තුව වියයුතු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | 2022.01.01 සිට බදු අයකරයි. |
| 05:01:01:VI | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පිහිටියාවූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු, ඔහුගේ සේවකයකු හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍ය ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලද මුදලෙන් සියයට එක (1%)ක සමාන බද්දක් 2022 වර්ෂයට පනවා අය කිරීමටත්, එකී බදු මුදල විකුණුම්කරු විසින් හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් එම ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් ගෙවිය යුතු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | 2022.01.01 සිට බදු අයකරයි. |
| 05:01:01:VII | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 118 වගන්තිය ප්‍රකාරව සහ මෙම සභාව විසින් පිළිගත් පොදු සම්මත අතුරු ව්‍යවස්ථාවේ 34 වන අතුරු | 2022.01.01 සිට බදු අයකරයි. |

| | | |
|---|---|---|
| | ව්‍යවස්ථාව අනුව ජල ගාස්තු අය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | |
| 05:01:01:VIII | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ ප්‍රකාශ යටපත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල දෙවන කොටසේ අංක 39 දරණ අතුරු ව්‍යවස්ථාවේ 3(2)යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් ගාස්තු 2022.01.01 වැනි දින සිට අය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | 2022.01.01 සිට බදු අයකරයි. |
| 05:01:01:IX | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් ගඟ ඉහළ කෝරළේ ප්‍රදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉහත උප ලේඛනයේ සඳහන් වෙනත් ගාස්තු 2022 වර්ෂයට අය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | 2022.01.01 සිට බදු අයකරයි. |
| 05:01:01:X | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2021 වර්ෂයේදී ඉහත උප ලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි II වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | 2022.01.01 සිට බදු අයකරයි. |
| 05:01:01:XI | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල දෙවන කොටසේ අංක 39 දරණ අතුරු ව්‍යවස්ථාවේ 06 යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම වෙනුවෙන් ඉහත උප ලේඛනයේ දැක්වෙන ගාස්තු 2022.01.01 වැනි දින සිට අය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | 2022.01.01 සිට බදු අයකරයි. |
| 05:01:01: XII | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැතිනම් හෝ ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත්කර නොමැති විටෙක, හෝ සැබැවින්ම ගොඩනැගිලි වලින් ආවරණයවූ ඒ ඉඩමේ බිම් ප්‍රමාණය,ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණයට නියමිත සමානුපාතයට වඩා අඩු සමානුපාතයක් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නාවූ හෝ ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති, බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 10% වඩා අඩු වන්නේනම්, එකී ඉඩම,සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2022 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ,භූමියේ ප්‍රාග්ධනය අගයෙන් සියයට එක(1%)ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | 2022.01.01 සිට බදු අයකරයි. |
| 05:01:01:XIII | 2022 වර්ෂය සඳහා ඝන අප ද්‍රව්‍ය බැහැර කරනු ලබන ස්ථාන සඳහා ගාස්තු පැනවීම ඉහත උප ලේඛනයේ ආකාරයට සිදුකිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | 2022.01.01 සිට බදු අයකරයි. |
| 05:01:02 | 2022 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණයකරන ලදි. | ලියාපදිංචි කර ඇත. |
| 05:01:03 | පළාත් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීම 2021 පළාත් පාලන ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ශ්‍රීධරන්පුර ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 03ක ප්‍රතිපාදන මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් විසින් වෙන් කර දී ඇති අතර එය රුපියල් මිලියන 03 නොඉක්ම වන කර්මාන්තයක් වන බැවින් යාබද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් වන උඩ පළාත ලේකම් කොට්ඨාශය තුළ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවෙකු වන මධ්‍යම පළාතේ ලියාපදිංචි අංක CPC – 066 දරණ 16 ඒ, අලුදෙණිය, හෙම්මාතගම චීෆ් | කොන්ත්‍රාත් ප්‍රදානය කර වැඩ අවසන් කර බිල්පත් ඉදිරිපත් කර ඇත. |

| | | |
|---|---|---|
| | ඉංජිනියරින් කොන්ත්‍රාත් ආයතනය වෙත ව්‍යාපෘතිය ප්‍රදානය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | |
| 05:01:04 | ව්‍යාජ සහතික ඉදිරිපත් කිරීම මත සුදුසුකම් සම්පූර්ණ නොකළ තනතුරක් දැරීම නීත්‍යානුකූල නොවන බැවින් එච්. පී.ඒ.කේ. සේනාධීර මිය විසින් ලබාගත් රජයට අයවිය යුතු මුදල් නීත්‍යානුකූලව නැවත අය කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ගම්පොල පොලීසියේ පැමිණිලි කර ඇත. |
| | කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ අංක 32 දරණ කඩ කාමරය ඉදිරිපිට වහලයක් ඉදිකර එළවළු පළතුරු වෙළඳාම් කිරීමට කුඩුවක් සකස් කර ගැනීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා නොදීමට තීරණය කරන ලදි. | සභා තීරණය දැනුම්දී ඉදිකිරීම නවතා ඇත. |
| 05:02 | සභා අරමුදල් 2021 යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ජී.ඩබ්.ජී.පී. ගුරුගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද "තැඹිලිගල සොහොන්පිටියේ සිට තැඹිලිගල දුම්රිය ස්ථානය දක්වා මාර්ගය පස් කපා සංවර්ධනය කිරීම " යන යෝජනාව සංශෝධනය කර "තැඹිලිගල දුම්රිය ස්ථානයේ සිට බ්‍රේසයිඩ් ජනපදය දක්වා දිවෙන මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීම" යන යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ක්‍රියාත්මක කර ඇත. |
| 06:01 | සැප්තැම්බර් මාසයට අදාළ කඩ කුලී මුදල් වලට අදාළ ප්‍රමාද ගාස්තු අය නොකර නිරෝධායන ඇඳිරිනීති කාල සීමාව අවසන් වූ පසුව අදාළ කඩ කුලී මුදල අය කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ප්‍රමාද ගාස්තු අය නොකර මාසික කුලී මුදල් අය කර ඇත. |
| 06:02 | 2021 මැයි, ජූනි හා සැප්තැම්බර් මාස වලට අදාළ ත්‍රී රෝද රථ නැවතුම් ගාස්තු නිරෝධායන ඇඳිරිනීති කාල සීමාව අවසන් වූ පසුව අය කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | මුදල් අය කරන ලදි. |
| 06:03 | උලපනේ ඩෙන්මාර්ක් කසළ අංගනයේ නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර කිලෝග්‍රෑම් එකක විකුණුම් මිළ රුः 12.00ක් ලෙසත් ත් ඇසුරුම් කරන ලද කිලෝ ග්‍රෑම් 05ක් වන පැකට්ටුවක මිළ රුः 100.00 බැගින්ද ඇසුරුම් කරන ලද කිලෝ ග්‍රෑම් 10ක් වන පැකට්ටුවක මිළ රුः 200.00ක් ලෙසද විකිණීම සුදුසු බවටත් තීරණය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | කාබනික පොහොර කිලෝග්‍රෑම් එකක විකුණුම් මිළ රුः 12.00ක් ලෙසත් ත් ඇසුරුම් කරන ලද කිලෝ ග්‍රෑම් 05ක් වන පැකට්ටුවක මිළ රුः 100.00 බැගින්ද ඇසුරුම් කරන ලද කිලෝ ග්‍රෑම් 10ක් වන පැකට්ටුවක මිළ රුः 200.00ක් ලෙසද අයකරයි. |
| 06:04 | උලපනේ කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ සවිකර ඇති පොලිතීන් පිළිස්සීමේ යන්ත්‍රයෙන් පොලිතීන් පිළිස්සීම සඳහා බාහිර ආයතන මගින් ලබාගැනීමට යෝජිත පොලිතීන් කිලෝග්‍රෑම් එකක් සඳහා තාක්ෂණ නිලධාරී මගින් ඉදිරිපත් කළ වාර්තාව අනුව පොලිතීන් කිලෝග්‍රෑම් එකක් රුः 50.00ක මුදලක් අය කර පොලිතීන් ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | පොලිතීන් කිලෝග්‍රෑම් එකක් රුः 50.00ක මුදලක් අය කර පොලිතීන් ලබා ගැනීම සිදු කරයි. |
| 06:05 | පළාත් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති (වෙනත් සේවා ව්‍යාපෘති) යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම සඳහා වෙන් කර දී ඇති රුපියල් මිලියන 03ක මුදලින් සභාවට අදාළ වන පොදු ගබඩාව සකස් කිරීම සකස් කර ඇති ඇස්තමේන්තුව අනුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශට අදාළව මධ්‍යම පළාතේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු වන මධ්‍යම පළාතේ ලියාපදිංචි අංක CPC – 066 දරණ 16 ඒ, අලුදෙණිය, හෙම්මාතගම චීෆ් ඉංජිනියරින් කොන්ත්‍රාත් ආයතනය වෙත ව්‍යාපෘතිය ප්‍රදානය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | කොන්ත්‍රාත් ප්‍රදානය කර වැඩ අවසන් කර බිල්පත් ඉදිරිපත් කර ඇත. |

## 2021.10.18 වන දින මහා සභාවේ ගනු ලැබූ තීරණ වල ප්‍රගතිය

| තීරණ අංකය | තීරණය | ගත් ක්‍රියා මාර්ගය/ ප්‍රගතිය |
|---|---|---|
| 05:01:01 | අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති හෙයින් සභාව වෙත ගෙවිය යුතු මුදල වන රුः 3000.00ක මුදලත් බදු අයිති මාරු කිරීමේදී සභාව වෙත ගෙවිය යුතු පැවරුම් ගාස්තුව වන රුः 75,000.00 ක මුදලක් අය කිරීමෙන් පසුව ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ අංක 01 කඩ කාමරයේ බදු අයිතිය එස්.එම්.එස්.එම්. සමරවීර යන අයට පවරාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සියලු මුදල් අය කර ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ අංක 01 කඩ කාමරයේ බදු අයිතිය එස්.එම්.එස්.එම්. සමරවීර යන අයට පවරා දී ඇත. |
| 05:01:02 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සෞන්දර්යාත්මක වටිනාකමකින් යුතු අසුපිනි ඇල්ල සංචාරක ආකර්ශණීය ප්‍රදේශයක් බවට පත් කර ඒ තුළින් අප ප්‍රාදේශීය සභාවට ආදායමක් උපයාගත හැකි ආකාරයට සංවර්ධනය කිරීම සඳහා යෝජනා කරමින් සකස් කළ ව්‍යාපෘති වාර්තාව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| | තීරණය කරන ලදි. | |
| 05:01:03 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කුරුඳුවත්ත නගර සංවර්ධන වැඩ සටහන යටතේ නව ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස ඉදිකිරීමට යෝජිත කුරුඳුවත්ත නව වෙළඳ සංකීර්ණයේ ව්‍යාපෘති වාර්තාව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය අනුව ඉදිරි කටයුතු කර ඇත. |
| 05:01:04 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට අඛණ්ඩ සේවාවක් ලබා දීම අරමුණු කර ගනිමින් ඔවුන්ගේ කටයුතු පහසු කරලීම සඳහා ඇත්ගාල උප කාර්යාලය සතියේ දින 05 තුළ අඛණ්ඩව පවත්වාගෙන යාම සුදුසු බවට ගරු මහා සභාව තීරණයකරන ලදි. | අනුමැතිය ලබා ගැනීමට කටයුතු යොදා ඇත. |
| 05:01:05 | 32-2645 අංක දරණ ජීප් රථය සඳහා ඉංජිනේරු වාර්තාව ලබා ගැනීමත් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් අලුත්වැඩියා කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහතා වෙත ලිපි යොමු කර ඇතත් මේ වන තෙක් එම මහතා වාහනය පරීක්ෂා කර නොමැත. |
| 05:01:06 | සෑම සතියකම සඳුදා, බදාදා සහ සිකුරාදා යන දින 03 තුළ ගම්පොළ නගර සභාව මගින් දිනකට කසළ ටොන් 06ක් බැගින් ලබා ගැනීමත් එකතු කරන කසළ ටොන් එකක් සඳහා රුː 1000.00 බැගින් මාසිකව එක් වන කසළ ප්‍රමාණයට අදාළ ගාස්තු අය කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | කසළ ටොන් එකක් සඳහා රුː 1000.00 බැගින් අය කර කසළඑකතු කරනු ලැබේ. |
| 05:01:07 | විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධන වැඩ සටහන 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද පිටකන්ද උතුර වෙල මැද පාර ආරම්භ ගත ස්ථානයේ පැති බැම්ම සහිතව සංවර්ධනය කිරීම වෙනුවෙන් මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය වෙතින් ලබා දෙන ලද රුː 999,121.35 ක මුදල එම කර්මාන්තය ක්‍රියාත්මක කරන ලද හල්දොල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ගෙවීම් සිදු කර ඇත. |
| 05:01:08 | වෙළඳ වාණිජ සහ සංචාරක දෙපාර්තමේන්තු ප්‍රතිපාදන සහ සභා අරමුදල් ප්‍රතිපාදන වැය කර ක්‍රියාත්මක කිරීමට යෝජිත රුපියල් මිලියන 12ක් වටිනා අසුපිනි ඇල්ල සංචාරක ව්‍යාපෘතියේ පළමු අදියරෙහි වැඩ කටයුතු සඳහා එම කර්මාන්ත වටිනාකමින් 20% ක මුදලක් ගෙවන ලෙස රුː 1,897,772.00ක මුදල එම කර්මාන්තය ක්‍රියාත්මක කරන මල්වත්ත කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ගෙවීම් සිදු කර ඇත. |
| 05:01:09 | 2021 වර්ෂයේ ඇතැම් වැය ශීර්ෂ සඳහා අයවැය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන හෙයින් වෙනත් වැය ශීර්ෂ වලින් ඉතුරු වන ප්‍රතිපාදන මුදල් ලබා ගැනීම සඳහා සකස් කරන ලද වැය ශීර්ෂ මාරු කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | වැය ශීර්ෂ මාරු කර අවශ්‍ය ප්‍රතිපාදන සළසා ඇත. |
| 06:01 | බල ප්‍රදේශයේ සුභ සාධක සමිති සඳහා ද්‍රව්‍ය ලබාදීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදලින් වියදම් දැරීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. |
| 06:02 | නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී. සරත් කුමාර ලාල් මහතා පත් කිරීම සුදුසු බවටත් පරිසර හා පොදු පහසුකම් පිළිබඳ කාරක සභා රැස්වීම සඳහා නවක ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.ජී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මියත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී. සරත් කුමාර ලාල් මහතාත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රාජකුමාර් විදුෂණී මහත්මියත් පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | අදාළ ගරු මන්ත්‍රීවරුන්ගෙන් යුක්තව කමිටු පැවැත්වේ. |
| 06:03 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් බදු පදනම මත ලබා දි ඇති සභා ඉඩම් වල අංක 01, 02 සහ 03 යන කට්ටි සඳහා නීත්‍යානුකූලව ඉඩම් ඔප්පු ලබා දීම සඳහා ගරු මහා සභාවේ එකඟතාවය ලබා නොදීමට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය දැනුම්දී ඇත. |
| 06:04 | කොරෝනා වසංගතය මර්ධනය කිරීම අරමුණින් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වයස අවුරුදු 30ට වැඩි ජනතාව සඳහා එන්නත්කරණ වැඩ සටහන පැවැත්වීම වෙනුවෙන් අප ප්‍රාදේශීය සභාව මගින් වැය කරන ලද ආහාරපාන සහ අනෙකුත් අවශ්‍යතාවයන් ඉටු කිරීම වෙනුවෙන් සභා අරමුදලින් පළමු අදියර සඳහා වැය වූ මුදල රුː 564,171.93 ක්ද දෙවන අදියර සඳහා වැය වූ මුදල රුː 786,200.40ක්ද වශයෙන් මුළු එකතුව රුː 1,350,372.33ක් ලෙස වැය කළ අතර එම වියදම් දැරීම වෙනුවෙන් ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | අවශ්‍ය ලිපි ලේඛන සකස් කරමින් පවතී. |

| | | |
|---|---|---|
| 06:05 | සභා අරමුදල් සහ අනෙකුත් ප්‍රතිපාදන මූලාශ්‍ර යටතේ ගරු මන්ත්‍රී කොට්ඨාශ සඳහා ලබා දෙන ප්‍රතිපාදන මුදල් වලින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති සංවර්ධන ව්‍යාපෘති අදාළ මන්ත්‍රී කොට්ඨාශයේ ලියාපදිංචි කොන්ත්‍රාත් සමිතියෙන් පමණක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය අනුව කටයුතු කරමින් පවතී. |

## 2021.11.16 වන දින මහා සභාවේ ගනු ලැබූ තීරණ වල ප්‍රගතිය

| තීරණ අංකය | තීරණය | ගත් ක්‍රියා මාර්ගය/ ප්‍රගතිය |
|---|---|---|
| 05:01:01 | 2022 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය කෙටුම්පත අනුමත කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | 2022.01.01 දින සිට ක්‍රියාත්මක කර ඇත. |
| 05:01:02 | 1961 අගෝස්තු 18 වන දින ලංකා ආණ්ඩුවේ 12,609 ගැසට් පත්‍රය මගින් ඇමුණුමේ සඳහන් සුසාන භූමි ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට පවරා මිනුම් කටයුතු සිදුකර ඇති ඉහත සඳහන් සුසාන භූමි වලට ප්‍රකාශන ඔප්පු ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ප්‍රකාශන ඔප්පු ලබා ගැනීමට කටයුතු යොදා ඇත. |
| 05:01:03 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් නීත්‍යානුකූල කර ගන්නා ලෙස තෙවන සිහිකැඳවීම් ලිපි යොමු කර ඇතත් මේ දක්වා ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති ඉහත සඳහන් අනවසර ඉදිකිරීම් සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | නඩු පැවරීම සඳහා නීතීඥ මහතා වෙත යොමු කර ඇත. |
| 05:01:04 | රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ **KD/RP/3800** සහ 2021.08.24 වන දිනැති තක්සේරු වාර්තාව අනුව 2019.09.01 දින සිට 2022.08.31 දක්වා වූ වසර 03ක කාලසීමාව සඳහා මසකට රුː 18,000.00ක කුලී පදනම මත ලංකා බැංකු ශාඛාව පවත්වාගෙන යාමට බදුදීම සුදුසු බවටත් ලංකා බැංකුව සමඟ නීත්‍යානුකූලව ගිවිසුම් ගත වීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කර ඇත. |
| 05:01:05 | අනුව තක්සේරු වාර්තාවට අනුව රුː 35,000.00ක මාසික වෙළඳපොළ කුලියක් මත වසර 03ක කාලයක් සඳහා ඇත්ගාල පොලිස් ස්ථානය පවත්වාගෙන යාමට මාසික බදු පදනම මතඇත්ගාල ක්‍රීඩාංගනය අසළ පිහිටි දැනට ඇත්ගාල පුස්තකාලය පිහිටි ගොඩනැගිල්ල ලබා දීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනිම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කර ඇත. |
| 05:01:06 | අප බල දේශයට අයත් අංක 215/ඒ, නාවලපිටිය පාර, උලපනේ ලිපිනයෙහි පදිංචි එස්.එච්.එම්. ෆරීඩ් මයාවිසින් පවත්වා ගෙන යනු ලබන ගව මස් වෙළඳසැළෙහි ගවමස් විකිණීම සඳහා 2022 වර්ෂය සඳහා වෙළඳ අයිතිය ලබා දීම සුදුසු බවටත් ගම්පොළ සහ නාවලපිටිය නගරයේ සිට ගව මස් ප්‍රවාහනය කිරීම සඳහා **CPAAG- 1951, CPAA- 4236, CPABO- 7836, CPABI- 8239** යන වාහන යොදා ගැනීම සඳහාද අවසර ලබාදීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | අනුමැතිය ලබා දී ඇත. |
| 06:01 | වරකාපිටිය මාර්ගය සකස් කිරීමේදී දුම්රිය මාර්ගයට පස් කඩා වැටීම වැළැක්වීමට දුම්රිය මාර්ගයට සමාන්තරව පැති බැම්මක් ඉදිකිරීමත් ඒ සඳහා කොන්ක්‍රීට් කාණු පද්ධතියක් ඉදි කිරීමත් වෙනුවෙන් දැනට සභාවේ ප්‍රතිපාදන නොමැති බවත් ඒ පිළිබඳව ඉදිරියේදී සොයා බලා කටයුතු කරන බව දුම්රිය දෙපාර්තමේන්තුවට දැනුම් දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | කොන්ක්‍රීට් කාණු පද්ධතියක් ඉදි කිරීමත් වෙනුවෙන් දැනට සභාවේ ප්‍රතිපාදන නොමැති බව අදාළ පාර්ශව වෙත දන්වා ඇත. |

## 2021.12.14 වන දින මහා සභාවේ ගනු ලැබූ තීරණ වල ප්‍රගතිය

| තීරණ අංකය | තීරණය | ගත් ක්‍රියා මාර්ගය/ ප්‍රගතිය |
|---|---|---|
| 05:01:01 | අනුව 2022 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනය අනුමත කිරීමසුදුසුබවට තීරණය කරන ලදි. | 2022.01.01 දින සිට ක්‍රියාත්මක කර ඇත. |
| 05:01:02 | 2022 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික සංවර්ධන සැළැස්ම, සිව් අවුරුදු සැළැස්ම, කෙටිකාලීන සැළැස්ම, මධ්‍යකාලීන සැළැස්ම හා දිගු කාලීන හෙවත් උපාය මාර්ගික සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | 2022.01.01 දින සිට සභා තීරණය අනුව ක්‍රියාත්මක වී ඇත. |
| 05:01:03 | 2022 වර්ෂය සඳහා සකස් කරන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | ක්‍රියාත්මක සැළැස්ම අනුව කටයුතු කරයි. |

| | | |
|---|---|---|
| 05:01:04 | 2022 වර්ෂයේ ඉහත සඳහන් කර ඇති ආකාරයට සෑම මසකම තුන් වන අඟහරුවාදා දිනයේ පෙ:ව: 09.30ට මහා සභා රැස්වීම් පැවැත්වීම සුදුසු බවට ගරු මහ සභාව තීරණය කරන ලදි. | සෑම මසකම තුන් වන අඟහරුවාදා දිනයේ පෙ:ව: 09.30ට මහා සභා රැස්වීම පැවැත්වීමට කටයුතු කර ඇත |
| 05:01:05 | 2022 වර්ෂය සඳහා සකස් කරන ලද ඵලදායිතා සැළැස්ම හා හරිත ඵලදායිතා සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය අනුව කටයුතු කරමින් පවතී. |
| 05:01:06 | ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2022 වර්ෂයේ <u>මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ</u> සංයුතිය ඉහත උප ලේඛනයේසඳහන් ආකාරයට වියයුතු බවටත් තීරණය කරන ලදි. | සභා තීරණය අනුව කටයුතු කරමින් පවතී. |
| 05:01:07 | ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් හා ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා කාර්මික හා කර්මාන්ත කමිටු කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2022 වර්ෂයේ <u>කාර්මික හා කර්මාන්ත කමිටු කාරක සභාවේ</u> සංයුතිය ඉහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත්ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය අනුව කටයුතු කරමින් පවතී. |
| 05:01:08 | ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් හා ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා පරිසර හා පහසුකම් පිලිබඳ කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2022 වර්ෂයේ <u>පරිසර හා පහසුකම් පිලිබඳ කාරක සභාවේ</u> සංයුතිය ඉහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය අනුව කටයුතු කරමින් පවතී. |
| 05:01:09 | ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් හා ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2022 වර්ෂයේ <u>නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ</u> සංයුතිය ඉහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය අනුව කටයුතු කරමින් පවතී. |
| 05:01:10 | 2022 වර්ෂයේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කටයුතු සඳහා ඉහතින් නම් කරන ලද මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ සාමාජිකයින්ගෙන් යුතු ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය අනුව කටයුතු කරමින් පවතී. |
| 05:01:11 | 2022 වර්ෂයේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලංසු විවෘත කිරීමේ කමිටුව ලෙස ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩී.එම්.එල්.ඩී. දසනායක මිය, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී ටී.සී.පී. ද සිල්වා මිය සහ ආදායම් පරීක්ෂක ඩබ්.ජේ.පී. ගුණරත්න මයා යන නිලධාරීන්ගෙන් යුත් කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය අනුව කටයුතු කරමින් පවතී. |
| 05:01:12 | 2022 වර්ෂයේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ කමිටුව ලෙස තාක්ෂණ නිලධාරී ඩබ්.එම්. මද්දුම බණ්ඩාර මයා, තාක්ෂණ නිලධාරී ඩී.ජී. නදුන් ජයසේකර මයා, පරිසර නිලධාරී පී. පී. එස්. ජේ. කිත්සිරි මයා සහ සංවර්ධන නිලධාරී බී.පී.ටී. දිසානායක මයා යන නිලධාරීන්ගෙන් යුත් කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය අනුව කටයුතු කරමින් පවතී. |
| 05:01:13 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැළැස්ම (පළමු අර්ධ වර්ෂය සහ දෙවන අර්ධ වර්ෂය) අනුමත කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය අනුව කටයුතු කරමින් පවතී. |
| 05:01:14 | 2022 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය අනුව කටයුතු කරමින් පවතී. |
| 05:01:15 | 2022 වර්ෂය සඳහා සකස් කරන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මානව සම්පත් සංවර්ධන පුහුණු සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය අනුව කටයුතු කරමින් පවතී. |
| 05:01:16 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභා බල ප්‍රදේශයේ කසළ එක්රැස් | පළාත් පාලන |

| | | |
|---|---|---|
| | කිරීම වෙනුවෙන් මිළදී ගැනීමට යෝජිත රුපියල් මිලියන 10ක් වටිනා කම්පැක්ටර් රථය සඳහා අප සභාව මගින් ගෙවිය යුතු 50% ක දායක මුදල වන රුපියල් මිලියන 05 ක මුදල ගෙවා කම්පැක්ටර් රථයක් මිළදී ගැනීම සුදුසු බවටත් ඒ සඳහා සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | දෙපාර්තමේන්තුව මගින් අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් ඇත. |
| 05:01:17 | මිළ ගණන් ඉදිරිපත් කළ එකම ආයතනය වන සී.අයි.සී. පොහොර සමාගම වෙත කාබනික පොහොර කිලෝග්‍රෑම් 01ක් සඳහා රුඃ 11.50ක තොග මිළක් ඉල්ලුම් කළද එයින් සභාවට පාඩුවක් සිදු වන බැවින් මින් පෙර මිළ ගණන් ඉදිරිපත් කළ බයෝෆුඩ් ආයතනයට කාබනික පොහොර කිලෝග්‍රෑම් 01ක් රුඃ 13.00 බැගින් විකිණීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | බයෝෆුඩ් ආයතනයට කාබනික පොහොර විකුණනු ලැබේ. |
| 05:01:18 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිසර බල පත්‍ර ලබා ගෙන ඇති ඉහත කර්මාන්ත හිමියන් මේ වන විට ව්‍යාපාර ස්ථාන වසා දමා ඇති නිසා එම ලිපි ගොනු වසා දැමීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | අදාළ ලිපි ගොනු වසා ඇත. |
| 05:01:19 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂය සඳහා සකස් කරන ලද කසළ කළමනාකරණ වැඩ සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා තීරණය අනුව කටයුතු කරමින් පවතී. |
| 05:01:20 | ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සමර්සෙට් කොරෝනා මධ්‍යස්ථානයට අවශ්‍ය ජලය බෙදාහැරීම වෙනුවෙන් අප ප්‍රාදේශීය සභාව සතු CPLL – 7322 අංක දරණ ජල බවුසරය යොදා ගත් අතර 2021.06.11 දින සිට 2021.11.11 වන දින දක්වා ජල බවුසරයට ඉන්ධන සැපයීම වෙනුවෙන් වැය කළ රුඃ 509,982.60 ක මුදල සභා අරමුදලින් වියදම් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභව තීරණය කරන ලදි. | ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. |
| 05:01:21 | කොළඹ විශ්ව විද්‍යාලයේ විශ්‍රාපන විද්‍යා ආයතනයේ පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව හදාරමින් සිටින බී.පී.ඒ.ටී. තිලකරත්න ශිෂ්‍යාවට දීමනාවකින් තොරව කුරුඳුවත්ත මහජන පුස්තකාලයේ පුහුණුව ලබා දීම සුදුසු බවට ගරු මහා සභව තීරණය කරන ලදි. | අදාළ පුහුණුව ලබමින් ඇත. |
| 05:01:22 | පංචිල නිවස, උඩහේන්තැන්න ලිපිනයේ පදිංචි අයි.පී. තරුෂි කාවින්ද්‍යා ඉගුරුවත්ත මෙනවියට දීමනාවකින් තොරව මෙම ආයතනයේ මාස 06ක පුහුණුවක් ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | පුහුණුව ලබා ගැනීමට ඉදිරිපත්වී නැත. |
| 05:01:23 | කුරුඳුවත්ත නගරයේ පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදි කිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ වැඩ කටයුතු අරම්භ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සඳහා 2022 වර්ෂයේ අයවැය අනුව සභා අරමුදලින් වෙන් කරන ලද රුඃ 12,500,000.00ක මුදලට අමතරව දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් 7.90% ක පොළී අනුපාතයට යටත්ව රුඃ 30,000,000.00 ක ණය මුදලක් ලබා ගැනීම සුදුසු බවටත් ඉතිරි මුදල ප්‍රාදේශීය සභාවේ ස්ථාවර තැන්පතුවෙහි ආයෝජනය කර ඇති මුදල් වලින් වැය කිරීම සුදුසු බවටත් මුළු ණය මුදල ලබා ගැනීමෙන් පසුව නියමිත ණය වාරික හා පොළී බැංකු ස්ථාවර නියෝග මගින් ගෙවීම සුදුසු බවටත් අවසන් වාරිකය ගෙවා අවසන් වන තෙක් බැංකු ස්ථාවර නියෝග වෙනස් නොකිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | පළාත් පාලන දෙපාර්තමේන්තු වෙත ඉල්ලුම් පත් ඉදිරිපත් කර ඇත. |
| 06:01 | 2022 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛන සකස් කර පොත් බැඳීම් කටයුතු කිරීම සඳහා එක් පොතකට රුඃ 700.00 බැගින් පොත් 30ක් බැඳීම් කිරීම වෙනුවෙන් දීමනා ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | අදාළ ගෙවීම් සිදු කර ඇත. |
| 06:02 | ඉහත ව්‍යාපෘතිය සඳහා වැය වන රුඃ 361,349.60 ක මුදල එම කොට්ඨාශය භාර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමියන් වෙත සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී. කොල්වින් සිල්වා මහතා වෙත 2021 වසරේ වෙන් කර ඇති ප්‍රතිපාදන වලින් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කර ඇත. |
| 06:03 | කුරුඳුවත්ත නගරයේ පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදි කිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ වැඩ කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් සකස් කළ ව්‍යාපෘති වාර්තාව අනුමත කිරීම සුදුසු බවටත් එම ව්‍යාපෘතියේ පළමු අදියරෙහි සංවර්ධන කටයුතු සිදු කිරීමට වැයවන ඇස්තමේන්තු මුදල වන රුපියල් 94,000,000.00 ක මුදලක් ඒ සඳහා වැය කිරීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ඒ අනුව පුවත්පතෙහි එළ කර විවෘත ලංසු කැඳවීමක් සිදු කර සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | කොන්ත්‍රාත් පිරිනමා ඇත. |
| 06:04 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උඩහේන්තැන්න මැදගොඩ හංදිය නගර සංවර්ධන වැඩ සටහන යටතේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ වැඩ කටයුතු සිදු කිරීම සඳහා රුපියල් 17,500,000.00 ක් වැය | ලංසු කැඳවා ඇත. |

| | | |
|---|---|---|
| | කිරීම සුදුසු බවටත් ඒ අනුව පුවත්පතෙහි එල කර විවෘත ලංසු කැඳවීමක් සිදු කර සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සුදුසු බවටත් ඒ සඳහා සකස් කළ ව්‍යාපෘති වාර්තාව අනුමත කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | |
| 06:05 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අසුපිණිඇල්ල සංචාරක ආකර්ශණීය ස්ථානයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති නැරඹුම් මැදිරිය යකඩ යොදා ඉදිකිරීමට නියමිතව තිබුණද වෙළඳපොලේ පවතින අධික මිළ සහ ද්‍රව්‍ය වල හිඟය හේතුවෙන් එම ඉදිකිරීම් සිදු කිරීමට අපහසුතාවයක් ඇතිව තිබීම නිසා එහි ඉදිරි කටයුතු කොන්ක්‍රීට් යොදා නිම කිරීම සුදුසු බවටත් එම කර්මාන්තය ක්‍රියාත්මක කරන ලද මල්වත්ත කන්ස්ට්‍රක්ෂන් ආයතනයෙන්ම එම සියලු කටයුතු සිදු කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි. | ඇස්තමේන්තු අනුව කටයුතු කර වැඩ අවසන් කර ඇත. |
| 06:06 | වර්තමානයේ වෙළඳපොලෙහි පවතින ද්‍රව්‍ය වල මිළ ගණන් ඉහළ යාම හේතුවෙන් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අසුපිණිඇල්ල සංචාරක ආකර්ශණීය ස්ථානයේ ඉදිකිරීම් සිදු කරන කොන්ත්‍රාත්කරු වන මල්වත්ත කන්ස්ට්‍රක්ෂන් ආයතනයෙන්ම නැවත මිළ ගණන් ලබා ගෙන එම මිළගණන් සසඳා බලා එය ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂා කිරීම සුදුසු බවටත් එම ඉංජිනේරු වාර්තා අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවටත් ගරු මහා සභව තීරණය කරන ලදි. | වැඩ අවසන් කර ඇත. |
| 06:07 | තත්ත්වය සළකා බලා එක් මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරි මහතෙකු සඳහා පෙට්‍රල් ලීටර් 05 බැගින් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | මෙම ඉන්ධන ලබා ගැනීම මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් විසින් ප්‍රතික්ෂේප කර ඇත. |
| 06:08 | ප්‍රාදේශීය සභා තැන්පතුවේ ඇති ඉහත සඳහන් කර්මාන්ත වල 10% අතරැඳවුම් කාලය වසර 02ක ඉක්මවා ඇති බැවින් එම මුදල් සභා අරමුදලට ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි. | සභා ආදායමට ගෙන ඇත. |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී. ප්‍රසන්න විමල් මනතුංග මහතා</u>

ගරු සභාපතිතුමනි, ගම්පොළ සිට දොලොස්බාගය දක්වා දිවෙන් මාර්ගයේ සිංහාපිටියේ සිට වැලිකන්ද දක්වා මාර්ගය මේ වන විට ඉතාම අබලන් තත්ත්වයේ තියෙන්නේ. සභාවක් වශයෙන් මහජනතාවගේ ඉල්ලීම් සළකලා එම පාරේ ඇති වලවල් පුරවලා දෙන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමා, ගම්පොළ සිට දොලොස්බාගය දක්වා දිවෙන් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් භාරදීලා තියෙන්නේ. ද්‍රව්‍ය හිඟය නිසයි මෙම මාර්ගයේ වැඩ කටයුතු ආරම්භ කරන්නේ නැත්තේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී. ගුණරත්න මහතා</u>

ගරු සභාපතිතුමනි, 2022.02.03 වන දින තැලිහුන්න විද්‍යාලයේ පැවති උත්සවයේ වැඩ කටයුතු සඳහා ඔබතුමා මට කම්කරුවන් දෙදෙනෙකු ලබා දුන්නා. එහෙත් එම කම්කරුවන් නිසි තැනක ස්ථානගත කරලා නෑ. කම්කරුවන් උදේ 8.00 ට කාර්යාලයට පැමිණියත් ඔවුන්ට යන්න වාහනයක් නෑ. උදේ ඔවුන් වැඩට යන වෙලාව පරක්කු වීම ඵලදායිතාවය නැති වීමට හේතුවක්. අවස්ථා දෙකකදී මම දැනුවත් කළත් එය නිසි ලෙස ඉටු වුණේ නෑ. හෙට යන්න තියෙන වැඩ අද සැළසුම් කරන්න. කම්කරුවන්ගෙන් නිසිලෙස වැඩ ගැනීමට වැඩ පිළිවෙලක් යොදන්න. ඒවා අදාළ නිළධාරීන්ට භාර දෙන්න. අපිට ගමට යන්න හැකිවෙන්නේ මාර්ග ශුද්ධ කරලා කාණු ශුද්ධ කරලා අවශ්‍ය පහසුකම් ලබා දුන්නොත් පමණයි. එම නිසා විශේෂ අවධානයක් යොමු කරලා කම්කරුවන්ගෙන් නිසි ලෙස වැඩ ගන්න වැඩ පිළිවෙලක් යොදන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා

ගරු සභාපතිතුමනි, උලපනේ බෝගොල්ල පාර සංවර්ධනය කරලා තියෙන්නේ. එහෙත් ජනපදවාසීන් මෙම මාර්ගයට අප ජලය මුදා හරිනවා. මේ පිළිබඳව සොයා බලා එම ජනතාව දැනුවත් කර එය වළක්වා ගැනීමට අවශ්‍ය සහාය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සතු මැදගොඩ හන්දිය නගර සංවර්ධන වැඩ පිළිවෙල දැනටම ආරම්භ කර තිබෙනවා. ගරු නාලක මන්ත්‍රීතුමා කොල්වින් මන්ත්‍රීතුමා, මනතුංග මන්ත්‍රීතුමා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කර ඊට අවශ්‍ය ඉදිරි කටයුතු සොයා බලා ඉටු කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. මේ පිළිබඳව අපි හැමෝම විශාල කැපවීමක් කළා. කොට්ඨාශ සඳහා වෙන් කරන ලද සංවර්ධන යෝජනා හැකිතාක් ඉක්මනින් අනුමත කරලා එවයි. ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමිය මුණගැසී සාකච්ඡා කරගන්නා ලෙස මම කොට්ඨාශ ජයග්‍රහණය කළ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. එසේම සභාපතිවරයෙක් වශයෙන් සේවය කිරීමේදී විශාල ගැටළු රාශියකට මුහුණ දෙනවා. කම්කරුවන් අවම වීම හේතුවෙන් කෙෂ්ත්‍රයේ වැඩ යම් ලෙසකින් අතපසු වෙනවා ඇති. ඒ පිළිබඳව මම සමාව ඉල්ලනවා. බඳවා ගැනීම් සීමා කරලා තියෙනවා. කම්කරුවන් නොමැතිව වැඩ ගොඩක් අතපසු වුණු කාලයක් මේ. කුරුඳුවත්ත නගරයේ නව වෙළඳ සංකීර්ණය ලබන සතියේ වැඩ ආරම්භ කිරීමට නියමිතයි. අසුපිණිඇල්ලේ වැඩ කටයුතුත් මේ වන විට ආරම්භ කර තිබෙනවා. ඒ පිළිබඳව මා ඔබ සියලුදෙනා දැනුවත් කරනවා. විශේෂයෙන් මෙහිදී මතක් කළ යුතුයි. අප සභාවේ සභා කටයුතු කරන තලතා මියට ස්ථාන මාරුවීමක් ලැබී මෙම ආයතනයෙන් යාමට සිදුව තිබෙනවා. එතුමිය විශාල කාර්යභාරයක් ඉෂ්ඨ කළා. එම සේවය අගය කිරීමට මම මෙය අවස්ථාවක් කරගන්නවා. සභා වාර්තාව සකස් කිරීමේදීත් සභාවේ කටයුතු කරගෙන යාමේදීත් ඔබතුමිය දැක්වූ සහයෝගයට ගරු මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් ස්තූතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමා

අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්ත වනබව ප්‍රකාශ කරන ලදි. අද දින සභාවාරය සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබාදුන් සියලුදෙනාටත් ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුදෙනාටත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු පෙ:ව: 11.35 ට අවසන් කරන ලදි.

සභාපති

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2022.02.15 වන දින ගඟ ඉහළ කෝරළේ

ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදිය